# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/79 – 2018 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා – 2018.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුව පළාත සුළු කොට්ඨාසයේ, වැලතුඩුව ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක කේ/බීඑල්ටී/2015/264 හා 2016.08.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත නම් සහ ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම් :

01. කැබලි අක්ෂර 'ඒ' – කරඳවත්ත (ඌරුමීවල වතුයායේ කොටසක්) – **ප්‍රමාණය: හෙක්. 0.5169**

උතුරට සහ නැගෙනහිරට: හල්ලොලුවේ ඔය; දකුණට: කැබලි අක්ෂර බී සහ ඇළ; බටහිරට: ඇළ සහ හල්ලොලුවේ ඔය.

02. කැබලි අක්ෂර 'බී' – කරඳවත්ත (ඌරුමීවල වතුයායේ කොටසක්) – **ප්‍රමාණය: හෙක්. 0.0775**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: හල්ලොලුවේ ඔය සහ කැබලි අංක සී; දකුණට: කැබලි අක්ෂර සී සහ ඇළ; බටහිරට: ඇළ සහ කැබලි අංක ඒ.

03. කැබලි අක්ෂර 'සී' – කරඳවත්ත (ඌරුමීවල වතුයායේ කොටසක්) – **ප්‍රමාණය: හෙක්. 9.4526**

උතුරට: කැබලි අක්ෂර බී සහ හල්ලොලුවේ ඔය; නැගෙනහිරට: හල්ලොලුවේ ඔය සහ ඌරුමීවල වත්ත; දකුණට: ඇළ; බටහිරට: ඇළ සහ කැබලි අංක බී.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4 - 3/15/2015/වීඊ/101.
2018 ජනවාරි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 578